# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2016 ඔක්තෝබර් මස 17 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 ඔක්තෝබර් මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 10.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2016 ඔක්තෝබර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 44/2015

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2016 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 431 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1979 අංක 15 දරන පනතේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ ''මාස හයක් ඇතුළත'' යන වචන වෙනුවට ''මාස දෙකක් ඇතුළත'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තියේ ''රුපියල් දෙදහස් පන්සියයක් හෝ ඊට වැඩි වන්නේ නම්'' යන වචන වෙනුවට ''රුපියල් ලක්ෂ එකක් හෝ ඊට වැඩි වන්නේ නම්'' යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය, එහි පැති සටහන ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය සංශෝධනය කිරීම.

''මාස දෙකක් ඇතුළත කිසිම හිමිකම්පාන්නකු පෙනී නොසිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 432අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— — ප්‍රධාන ප්‍රඥප්තියට 432අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2—PL 010024—2,861 (2016/06)

''මාස දෙකක් ඇතුළත හිමිකම් පාන්නකු පෙනී සිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.

432අ. (1) එම දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා මාස දෙකක් ඇතුළත ස්වකීය හිමිකම තහවුරු කරන අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සිතනු ලබන කොන්දේසි මත, එම දේපළ ඔහුට ආපසු භාරදෙන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය:

එසේ වුව ද, එම දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා එම දේපළේ සන්තකය භාර ගැනීමට කැමති නොවන අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් යටතේ එම දේපළ විකුණනු ලැබිය හැකි ය.

(2) නඩුවේ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරන තුරු, එම දේපළ විකිණීමෙන් ලැබෙන ආදයම රජයට අයත් බැංකුවක තත්කාර්ය සඳහා විවෘත කර ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දේපළෙහි සන්තකයට හිමිකම ඇති තැනැත්තා විසින් එම දේපළේ වටිනාකම ලබා ගැනීම සඳහා නියමිත ආකෘතියෙන් සහ නියමිත ආකාරයට ඉල්ලීමක් කළ යුතු අතර, නඩුවේ වාර්තා කරන ලද තීන්දු ප්‍රකාශයට යටත්ව මුදල් ගෙවීම සිදු කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් තැන්පතු ගිණුම පරිපාලනය සහ කළමනාකරණය කරන ආකාරය නියම කරමින් නියෝග සාදනු ලැබිය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.